**විෂය** - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

**ශ්‍රේණිය** - 8

**මාසය** - සැප්තැම්බර් **සතිය** - 01 **ක්‍රියාකාරකම් අංකය** - 33

**සැකසුම**- ඊ.අංජලී සඳරේඛා - ර/ඇඹි/ආදොළුව විද්‍යාලය

# 5 - භෞතික ආගණනය සඳහා මෘදුකාංග භාවිතය

## 5.1 AND තාර්කික ද්වාරය හැඳින්වීම

### ශිෂ්‍ය කාර්යය -

- පාඩම හොඳින් අධ්‍යයනය කරන්න. (කියවීම් පොතේ පිටු අංක 55 - 56)
- අමාරු/අපහසු පාඩම් කොටස් වැඩිහිටියෙකු/ ගුරුවරයෙකු විමසා අවබෝධ කරගන්න.
- මාර්ගගත හෝ මුද්‍රිත ඉගෙනුම් ආධාරක මගින් පාඩමට අදාළ ඉගැන්වීම්, පාඩම් ලබාගෙන ඉගෙනගන්න.
- මෙම කාර්ය පත්‍රිකාවේ සඳහන් ක්‍රියාකාරකම් සහ මෙම පාඩමට අදාළව ඔබේ කියවීම් පොතේ හා වැඩපොතේ සඳහන් ක්‍රියාකාරකම් සිදුකරන්න.
- ක්‍රියාකාරකම් සිදුකිරීමේදී ඔබට එන ගැටළු ඔබේ යහළුවන්, වැඩිහිටියන් හා ගුරුවරුන් සමඟ සාකච්ඡා කර විසඳුම් ලබාගන්න.

### මෙම පාඩමට අදාළව උපකාර කරගත හැකි ඉගෙනුම් ආධාරක -

- e නැණපියස - https://www.enenapiyasa.lk/lms/pluginfile.php/15430/mod_resource/content/1/andGate.html
- ගුරු ගෙදර - https://www.youtube.com/watch?v=f72i8fcnG5M
- වෙනත්
  - Youtube - https://www.youtube.com/watch?v=NrUgMWvG-1U

    https://www.youtube.com/watch?v=3blG7nyxL5M

### මෙම පාඩම තුළින් ලබාගත හැකි ඉගෙනුම්ඵල -

- මූලික තාර්කික ද්වාර නම්කරයි.
- AND ද්වාරයේ ක්‍රියාකාරීත්වය හඳුනාගනියි.
- AND ද්වාරයේ ක්‍රියාකාරීත්වය එදිනෙදා ජීවිතයේ අවස්ථා ඇසුරින් පැහැදිලි කරයි.
- AND ද්වාරයේ ක්‍රියාකාරීත්වය ඇසුරින් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.
- එදිනෙදා ජීවිතයේ ගැටළු විසඳීම සඳහා AND ද්වාරයේ සිද්ධාන්ත යොදාගනියි.

**ඇගයීම්/ තක්සේරුකරණ ක්‍රමවේදය හා ආකෘතිය -**

## පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. මූලික තාර්කික ද්වාර 3 නම් කරන්න.
02. AND තාර්කික ද්වාරයේ ක්‍රියාකාරීත්වය පැහැදිලි කරන්න.
03. AND තාර්කික ද්වාරයට අදාළ සම්මත සංකේතය ඇඳ ඊට අදාළ බූලිය ප්‍රකාශනය ලියා දක්වන්න.
04. AND තාර්කික ද්වාරයට අදාළ සත්‍යාපන වගුව ගොඩනගන්න.
05. AND තාර්කික ද්වාරයේ එදිනෙදා ජීවිතයේ ප්‍රායෝගික භාවිතයන් සඳහා උදාහරණ 3ක් පැහැදිලි කරන්න.